# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,362 - 2023 දෙසැම්බර් මස 08 වැනි සිකුරාදා - 2023.12.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 422 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 425 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 දෙසැම්බර් මස 29 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 දෙසැම්බර් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සිතාරා රුවිනි ගමගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2009.08.20 දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/අකෝ/2274 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කාසල්රි ජනපදයේ පදිංචි වීරන් මූර්ති වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. බී 15/255 යටතේ 2009.12.15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.12.29** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

### එකී උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹගමුව කෝරළේ ලෙතන්ටි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කාසල්රි නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, නුවරඑළිය මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති පි. පි. නු. 2416 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 36 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.088 ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : කාසල්රි කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 25 සහ 21, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 21 සහ 37, |
| *දකුණට* | : | කැබලි අංක 37 සහ 38, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 38, 24 සහ 25. |

සිතාරා රුවිනි ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය,
ගිනිගත්හේන.

2023 ජූලි මස 31 වැනි දින.

12-268

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාතේ පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එච්. කේ. සාගරිකා දිල්හානි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983.12.09 දින ප්‍රදානය කර ඇති අංක මහ/ප්‍ර/3317 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අපෝන්සුවත්ත ජනපදයේ පදිංචි ගන්නිලේ හේරත් මුදියන්සේලාගේ රම්බණ්ඩා වෙත ප්‍රදානය කොට මහනුවර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ජී. 133/1033 යටතේ 1985.10.14 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටි ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.12.29** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

### උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාවිස්ස පත්තුවේ/කෝරළේ පාතමයිලපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පල්ලේ මයිලපිටිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 54/25/4 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මු.පි.මහ. 2324 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 112 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/0.149 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම පල්ලේමයිලපිටිය

| | | |
|---|---|---|
| *උතුරට* | : | ප්‍රවේශ මාර්ගය, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 113, |
| *දකුණට* | : | මිනිරන්ගල වත්ත, |
| *බස්නාහිරට* | : | ප්‍රවේශ මාර්ගය සහ කැබලි අංක 111. |

එච්. කේ. සාගරිකා දිල්හානි,
ප්‍රාදේශීය ලේකම්,
පාතහේවාහැට,
තලාතුඔය.

2023 පෙබරවාරි මස 10 වැනි දින.

12-269/1

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

#### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එච්. කේ. සාගරිකා දිල්හානි වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983.12.09 දින ප්‍රදානය කර ඇති අංක මහ/ප්‍ර/3288 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අපෝන්සුවත්ත ජනපදයේ පදිංචි බෝදන්ඩරාවේ ගෙදර සෙනෙවිරත්න වෙත ප්‍රදානය කොට මහනුවර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ජී. 116/390 යටතේ 1990.07.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටි ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.12.29** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

#### එකී උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාවිස්ස පත්තුවේ/කෝරළේ පාතමයිලපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පල්ලේ මයිලපිටිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ අංක මු.පි.මහ. 2324 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 05 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.105 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම

| | |
|---|---|
| *උතුරට* | : ප්‍රවේශ මාර්ගය, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 06, |
| *දකුණට* | : කැබලි අංක 13, |
| *බස්නාහිරට* | : කැබලි අංක 04. |

එච්. කේ. සාගරිකා දිල්හානි,
ප්‍රාදේශීය ලේකම්,
පාතහේවාහැට - තලාතුඔය.

2023 පෙබරවාරි මස 10 වැනි දින.

12-269/2

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

#### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එච්. කේ. සාගරිකා දිල්හානි වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983.12.09 දින ප්‍රදානය කර ඇති අංක මහ/ප්‍ර/3299 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අපොන්සුවත්ත ජනපදයේ පදිංචි බෝල්පනේ මුදියන්සේලාගේ රම්බණ්ඩා වෙත ප්‍රදානය කොට මහනුවර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ජී. 116/387 යටතේ 1990.07.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටි ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.12.29** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

#### උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාවිස්ස පත්තුවේ/කෝරළේ පාතමයිලපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පල්ලේ මයිලපිටිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 54/25/4 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මු.පි.මහ. 2324 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 35 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.121 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම

| | |
|---|---|
| *උතුරට* | : හි. පි. 44988 දරන ඉඩම (පාර හැර) |
| *නැගෙනහිරට* | : කැබලි අංක 34, |
| *දකුණට* | : කට්ටි අංක 36 සහ 37, |
| *බස්නාහිරට* | : හි. පි. 44988 දරන ඉඩම. |

එච්. කේ. සාගරිකා දිල්හානි,
ප්‍රාදේශීය ලේකම්,
පාතහේවාහැට - තලාතුඔය.

2023 පෙබරවාරි මස 10 වැනි දින.

12-269/3

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. එම්. ශමීර නුවන් රත්නායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.04 දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/පස්/733 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ඉඹුල්පිටිය වත්තහි පදිංචි හීංකෙන්ද මුදියන්සේලාගේ ගුණවර්ධන වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. ජ් 05/79 යටතේ 1996.02.08 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය **2023.12.29** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පස්බාගේ/කෝරළයේ, ඉඹුල්පිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, හෝල්ගම නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 61/22/2 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මූපී මහ 2299 දරන රේඛා සටහනේ අංක 33 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.207 ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම - ඉඹුල්පිටිය වත්ත

*උතුරට* : 32 කැබැල්ල  
*නැගෙනහිරට* : 14, 34 කැබලි,  
*දකුණට* : 40, 34 කැබලි,  
*බස්නාහිරට* : 14, 32 කැබලි.

ආර්. එම්. ශමීර නුවන් රත්නායක,  
ප්‍රාදේශීය ලේකම්,  
පස්බාගේ කෝරළේ.

2023 පෙබරවාරි මස 22 වැනි දින.

12-270/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. එම්. ශමීර නුවන් රත්නායක වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983.07.01 දින ප්‍රදානය කර ඇති අංක මහ/ප්‍ර/1835 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන මාපාකන්ද ජනපදයේ පදිංචි පකීර් තම්බි රයීනා උම්මා වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඒ 1/125 යටතේ 1985.03.15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය **2023.12.29** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පස්බාගේ පත්තුවේ/කෝරළයේ මාපාකන්ද උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දෙකිඳ නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක ඇල් 10/17, 25 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක පිපි ඒ 1120 දරන රේඛා සටහනේ අංක 55 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර අක්කර 02 රූඩ් 01 පර්චස් 27 ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම - මාපාකන්ද ජනපදය.

*උතුරට* : කට්ටි අංක 52 සහ 54,  
*නැගෙනහිරට* : කට්ටි අංක 57,  
*දකුණට* : කට්ටි අංක 56,  
*බස්නාහිරට* : කට්ටි අංක 56.

ආර්. එම්. ශමීර නුවන් රත්නායක,  
ප්‍රාදේශීය ලේකම්,  
පස්බාගේ කෝරළේ.

2023 පෙබරවාරි මස 14 වැනි දින.

12-270/2

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/60563.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : UPLC/L/14/HT/L/73/2019

බදුල්ල දිස්ත්‍රික්කයේ, හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 63බී, දියතලාව ග්‍රාම නිලධාරි වසමේ දියතලාව ගමේ න. මැ. මු. පි. 28 හි කැබලි අංක 172 හි කොටසක් වන අංක 2017/36 අනුරේඛනයේ කැබලි අංක A මගින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0155 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුත්තක් සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ග (මාර්ග සංවර්ධන අධිකාරිය) සඳහා වෙන් කළ බිම, |
| *නැගෙනහිරට* | : | ගුණසේකර භුක්ති විඳින ඉඩම (කැම්ප් හොටෙල්, |
| *දකුණට* | : | කැබැල්ල බී, |
| *බටහිරට* | : | මාර්ගය සඳහා වෙන්කළ බිම. |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට හා පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහ (30) යි. (2021.03.25 සිට 2051.03.24 දක්වා)

*(ආ)* *වාර්ෂික බදු මුදල*.- 2021 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2021 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුලත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය,

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

*(ඊ)* සාදා ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් මෙම ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුල අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2021.03.25 සිට වසර 05 ක් ගතවන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*මෙම නිවේදනය* පල වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 නොවැම්බර් මස 13 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැඳුර"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-131

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/73451.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : UPLC/L/13/BW/L/477

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 67, ඇත්තලපිටිය ග්‍රාම නිලධාරි වසමේ, ඇත්තලපිටිය ගමේ අංක B/BND/2014/224 අනුරේඛනයේ කැබලි අංක B මගින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0079 ක් වූ ඉඩම් කොටස සමිති කටයුතු සඳහා එරණවෙල එක්සත් සුභසාධක මරණාධාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | B/BND/2014/224 හි කැබලි අංක A, අ.ග.පි. 26 හි කැබලි අංක 988 හා 992, |
| *නැගෙනහිරට* | : | අ.ග.පි. 26 හි කැබලි අංක 992 හා 991, |
| *දකුණට* | : | අ. ග. පි. 26 හි කැබලි අංක 992 හා 991, |
| *බටහිරට* | : | අ. ග. පි. 26 හි කැබලි අංක 992, 988 සහ B/BND/2014/224 හි කැබලි අංක A |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* .- අවුරුදු පහයි. (05) (2023.10.10 සිට 2053.10.09 දක්වා)
*වාර්ෂික බදු මුදල*.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2023 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

*(ආ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය,

*(ඉ)* සාදා ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් මෙම ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුල අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදුගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*මෙම නිවේදනය* පල වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2023 නොවැම්බර් මස 15 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-156

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/73601.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/IB/LS/BAT/MSW/05

මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 127 - සි කට්සේනයි ග්‍රාම නිලධාරි වසමේ කට්සේනයි ගමේ පිඹුරේ ප්‍රමාණයෙන් පර්චස් 71.66 කට අදාළව රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාණිජ කටයුතු (වී ගබඩාවක්) සඳහා විනෝදනී ජීවරාජ් වෙත බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කාන්තප්පන්ගේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | කුමාරපොඩිගේ ඉඩම, |
| *දකුණට* | : | පාර, |
| *බටහිරට* | : | නුදල්විලිගේ ඉඩම. |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහ. (30) යි (2023.10.10 දින සිට 2053.10.09 දක්වා)

වාර්ෂික බදු මුදල :- ගරු ඇමතිතුමා අනුමත කරන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳ පොල වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල :- වාර මුදලක් අය නොකරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2023.10.10 දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*මෙම නිවේදනය* ගැසට් පත්‍රයේ පල කල දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 නොවැම්බර් මස 16 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-157

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/67209.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LB/LS/BAT/MN/36.

මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සත්තුරුකොන්දන් ග්‍රාම නිලධාරි වසමේ, සත්තුරුකොන්දන් ගමේ ප්‍රමාණයෙන් අක්කර 10 කට අදාලව රජයේ ඉඩම් ආඥා පනත යටතේ කොඩ්ඩාමුනෙයි ක්‍රීඩා ගම්මාන භාරකාර මණ්ඩලය වෙත බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

*උතුරට* : සින්න සවුකඩි සහ පාර,
*නැගෙනහිරට* : සින්න සවුකඩි සහ පාර,
*දකුණට* : සින්න සවුකඩි,
*බටහිරට* : සින්න සවිකඩි.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* .- අවුරුදු පහ (05) යි (2023.10.10 සිට ඉදිරියට)
වාර්ෂික බදු මුදල :- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2023 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කොඩ්ඩාමුනෙයි ක්‍රීඩා ගම්මාන භාරකාර මණ්ඩලය සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියාකරනු ලැබේ.

*(උ)* 2023.10.10 දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*මෙම නිවේදනය ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 නොවැම්බර් මස 17 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-158

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.